ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ සන්නිවේදන දෙපාර්තමේන්තුව

දිනය 2014 ජුනි 30

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 ජුනි**

මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි 2014 ජුනි මාසය තුළ ප්‍රගතියක් අත්පත්කර ගන්නා ලද අතර, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් තමන්ගේ ඒකාබද්ධවීම/අත්පත්කර ගැනීම සඳහා තම පුළුල් යෝජනා මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. එකී සමාගම්වලට තවදුරටත් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට යාම පහසු කිරීම සඳහා, එම සැලසුම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාලෝචනය කරනු ඇත.

- බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, ඒකාබද්ධවීම/අත්පත්කර ගැනීම සඳහා හඳුනාගන්නා ලද පාර්ශව සමඟ සාකච්ඡා සිදුකරන අතරම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා වූ විශේෂ ඒකකය සමඟ ද සමීප සබඳතාවයක් පවත්වා ගන්නා ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි, අදාළ විගණන ආයතන, සාකච්ඡා ස්වාධීනව කරගෙන යාම පහසු කිරීම සඳහා, ගනුදෙනු කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදුකර ගෙන යන ලදී.

- දැනටමත් ආරම්භ වී ඇති ඒකාබද්ධවීම්, එනම්, ඩීඑෆ්සීසී බැංකුව සහ එන්ඩීබී බැංකුව සහ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්බීඑස්එල් සේවින්ග්ස් බැංකුව සහ එම්සීඑස්එල් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්, වලට අදාළ කටයුතු අවශ්‍ය අවස්ථාවන්හිදී බාහිර උපදේශකයන්ගේ සහාය ද සහිතව ඉදිරියට ගෙන යන ලදී. මේ අතර, ඇසෙට්ලයින් ලීසිං කම්පැණි ලිමිටඩ් වෙත ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් අත්පත්කර ගැනීමට සහ ඊකේඑස් ෆයිනෑන්ස් ලිමිටඩ් වෙත ඒෂියන් ෆයිනෑන්ස් ලිමිටඩ් අත්පත්කර ගැනීමට මුදල් මණ්ඩලයේ නිල අනුමැතිය ලබාදෙනු ලැබිණි. මේ සමගම, එකම ආයතන සමූහයකට අයත්වන බැංකු නොවන මූල්‍ය ආයතන තම ඒකාබද්ධවීමේ

කටයුතු අඛණ්ඩව කරගෙන යන ලද අතර, තවත් ආයතන කිහිපයකට ඒකාබද්ධවීම සඳහා අවශ්‍ය මූලික අනුමැතිය ලබාදෙන ලදී.

- තවද, මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින්, බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයක මූල්‍ය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය අරමුදල් ලබාදීමට අනුමැතිය ලබාදෙන ලදී. එමගින් එකී ආයතනවලට සුදුසු ඒකාබද්ධවීම්/අත්පත්කර ගැනීම් සඳහා අවශ්‍ය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වේ යැයි අපේක්ෂා කරමු.

- 2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත අනුව, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට අනුබලදීමට ලබාදෙන බදු සහන පිළිබඳ මාර්ගෝපදේශයන් පිළියෙල කිරීමට අදාළ උපදේශන ක්‍රියාවලිය අවසන් කොට ඇති අතර, ඒ පිළිබඳව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත. මෙම මාර්ගෝපදේශයන් නොබෝ දිනකින් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවලට නිකුත් කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

- ලංකා බැංකු සේවක සංගමයේ නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම ඇතුළුව, මෙම මාසය තුළදී ද, ඒකාබද්ධවීමේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධිත සියලු පාර්ශව සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව සමීප සබඳතාවයක් පවත්වා ගන්නා ලදී.